# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2310/35 - 2022 දෙසැම්බර් මස 15 වැනි බ්‍රහස්පතින්දා - 2022.12.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත**

10අ(1)(අ) වගන්තිය යටතේ දැන්වීම

**ගලේවෙල ප්‍රාදේශීය සභාව**

ගලේවෙල ප්‍රාදේශීය සභාවේ සභිකයකු වන හේරත් මුදියන්සේලා වෙදගෙදර ජයන්ත හේරත් මහතා එක්සත් ජනතා නිදහස් සන්ධානයේ සාමාජිකයකුව සිටීම අවසන් කර ඇති නිසා එම සභාවේ ඔහුගේ සභික ධුරය ඔහු විසින් අතහැර ඇති බව, ගලේවෙල ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි පුලස්ති පතිරණ වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 10අ(1)(අ) වැනි වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි.

**පුලස්ති පතිරණ,**
තේරීම්භාර නිලධාරි,
ගලේවෙල ප්‍රාදේශීය සභාව.

2022 දෙසැම්බර් මස 08 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
මාතලේ.

EOG 12 - 0159


1A - G 38316 — 26 (2022/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ මඩකලපුව මහ නගර සභාවේ සභික ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන මඩකලපුව මහ නගර සභාවේ සභික ධූරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ මඩකලපුව මහ නගර සභාවේ අංක 7 මාමාංගම් කොට්ඨාසයට තේරී පත් වූ පුස්පරාජ් රූපරාජ් අයත් වන්නා වූ ඉලංකෙයි තමිල් අරසු කච්චි නම්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම මඩකලපුව මහ නගර සභාවේ අංක 7 මාමාංගම් කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා ඈන් යුක්කිරිස්ටියා වල්ත්තසාර් නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

මඩකලපුව මහ නගර සභාවේ තේරීම්භාර නිලධාරී, මුහෙයියදීන් බාවා මුහම්මදු සුෆ්යාන් වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1)(අ) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින් ඈන් යුක්කිරිස්ටියා වල්ත්තසාර්, මඩකලපුව මහ නගර සභාවේ අංක 7 මාමාංගම් කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් ප්‍රකාශ කරමි.

**එම්. බී. එම්. සුෆ්යාන්,**
තේරීම්භාර නිලධාරී,
මඩකලපුව මහ නගර සභාව.

2022 දෙසැම්බර් මස 14 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
මඩකලපුව.

EOG 12 - 0160

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.